
# මල් වැහි පොද




සිසිර දිසානායක

හැටේ දශකයේ අග භාගයේදී ඇරඹී සැත්තෑව දශකය හරහා ගලා ආ හෙළ ගීයේ ප්‍රවණතාව මේ වන විට ඊට ඉඳුරාම වෙනස් මඟකට යොමු වෙමින් පවතින බව මව් බිමේ මාධ්‍ය නාලිකාවන්ගේ ඇසුර ලබන රසිකයිනට නම් නොරහසකි. ඊට නව තාක්‍ෂණ ක්‍රමවේදයන් ද රුකුලක් වී ඇති සේ ය හැඟෙන්නේ. අයාලයේ යන වර්තමාන ගී රැල්ල එකී සුභාවික ගීතයෙන් මිදී වෙනතක ගලා ගිය ද විටින් විට මව්



බිමේ ජ්‍යෙෂ්ඨ ප්‍රවීණයින් උඩු ගං බලා යාමට දරනා ප්‍රයත්නයන් ද නැතුවා නොවේ.

කවදත් ඉවසිලිමත් ව සරු ගේය පද රචනාවන් පෙළක් තෝරාගෙන නිසි මියැසි හුරුවන් වෙත යොමු කරවා හරවත් මියුරු ගී රසිකයිනට දායද කල ගායන ශිල්පියෙකි සුනිල් එදිරිසිංහයන්. දහසය හැවිරිදි ගැටවරයෙකු ලෙසින් වික්ටර් රත්නායකයන්ගේ සංගීතයට අනුව "සඳකඩ පහණක කැටයම් ඔපලා" යන වොලී නානායක්කාරයන්ගේ පද පෙළ ගීතවත් කරමින් ගායන ක්‍ෂේත්‍රයට පිළිපන් එදිරිසිංහයන් විසින් වඩාත් මුහුකුරා ගිය ශිල්පියෙකු ලෙසින් නුදුරේදී එළිදැක්වීමට සූදානම් වන නවත ම ගීත එකතුව පිළිබඳව යි මෙවර "ගී සඳළුවේ" කතිකාවත.

"මේ ගීත එකතුව අපි නම් කරලා තියෙන්නේ "මල් වැහි පොද" කියලයි. සුනිලුන් දුරකථනය හරහා අප හා යා වූවා.

"අපේ මව් බිමේ දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ පැවතුණ යුධමය වාතාවරණය දැන් ඉවරයි. ඉතින් දැන් අපි ඉන්නේ පශ්චාත් යුද සමයක. රටක සංස්කෘතිය සදාචාරය, චින්තනය බොහොම හැල හැප්පීම්වලට භාජනය වුණ කාලයකට පස්සෙ ලැබුණ මේ නව යුගය රටේ ඒකග්‍රතාවය තහවුරු කරගන්නට අපි ලබපු හොඳ ම අවස්ථාවක්. ඉතින් ඒ වෙනුවෙන් අනික් සියලුම මතවාද පසෙකට ලා අළුත් ලොක්යක් හදමු කියන අදහසයි "මල් වැහි පොද" ගීතයෙන් කියවෙන්නේ. අපේ ප්‍රවීණ ගීත රචකයෙකු වන රත්න ශ්‍රී විජේසිංහ කවියා ලියපු මේ ගීතයෙන් කියවෙන්නේ කාලීන අදහසක් නිසා මගේ අළුත් ම ගී එකතුව ඒ නමින් ම නම් කරන්න හිතුවා."

"අපි මේ ගීත එකතුව ඉදිරි මාස කීපය ඇතුලත රසිකයින්ට තිළිණ කරන්නයි බලාපොරොත්තුව. පද රචනා ටික තෝරගෙන, සංගීත නිර්මාණය කරගෙන මේ වෙනකොට පටිගත කිරීම් නිම වෙමිනුයි තියෙන්නේ."

මල් වැහි පොදට ආරාධනා
ඉවරයි අසෙනි හෙණ ගර්ජනා
නිල් දෙරන මල් යහනක් කරන්නට
මල්වලට ආරාධනා.....

ගිනි අවි නිවී ළතැවුල් සිඳී ගිය ගම්දොරේ
කුණු කසළ සේදී ගිහින් උතුරන ගං දියේ
නව සිතින් සිතුවිල්ලක් සිතා
නව අතින් නව නිමැවුම් මවා
අළුත් මහ පොළවකට මේ ආරාධනා

රහසේ ම පිපලා පරවෙලා යන ජීවිතේ
හැකිනම් පුදන්නට ඉත සිතින් පූජාසනේ
එක වියැට වී කරලක් වෙලා
හෙට රන්වනින් වගුරයි සිනා
ඒ මහා පින්කමට මේ ආරාධනා

රත්න ශ්‍රී විජේසිංහ

මේ වතාවෙ මේ සංගත තැටිය නිර්මාණය වෙලා එළිදැක්වෙන්නේ "සංඛන" ලේබලය යටතේයි. රජීව වෙල්ගම, කිරම සුමංගල හිමි, රත්න ශ්‍රී විජේසිංහ, යමුනා මාලිනී, ගයා රම්‍ය අල්විස්, ජනිත් හේවා-වසම්, ආචාර්ය ප්‍රශාන්ත පතිරිණ, ඒ.එම්.අයි. ස්වර්ණසිංහ, කුමාරදාස සපුතන්ත්‍රි, පමිත ආර් ලියනගේ, කරුණාරත්න ජයතිලක, රංජිත් රූපසිංහ, බන්ධුල නානායක්කාරවසම්, නෙල්සන් ඩේමුණි, සුමද්‍ර වෙත්තසිංහ, සුනිල් සේමගේ යන අයගේ ගී පද සංකල්පනා මේ එකතුවට එකතු වෙනවා. දිවංගත කුමාරතුංග මුණිදාස කවියාගේ රචනාවකුත් මම ගායනයට තෝරාගත්තා.

"මෙම පදරචනා තෝරා ගැනීමේ දී කුමාර ලියනගේ සහෘදයා දුන්න සහයෝගය විශේෂයෙන් සඳහන් කරන්න ඕන. තමන් ගේය පද රචකයෙක් වුණත් තමන්ගේ ගීතයක් මේ එකතුවට රිංගවාගන්න කුමාර උත්සහ නොකළ එක තවත් විශේෂත්වයක්.

රෝහණ වීරසිංහ, එච්.එම්. ජයවර්ධන, නවරත්න ගමගේ, සුනිල් දයානන්ද කෝනාර, ආනන්ද ගමගේ, නාලක අංජන, දර්ශන රුවන් දිසානායක, කරුණාරත්න විජේවර්ධන, ආනන්ද පෙරේරා, අසේල බණ්ඩාර, මහානාම වික්‍රමසිංහ යන ශිල්පීන් සංගීතයෙන් දායක වෙනවා. ගීත හතරකට ම සංගීතය නර්මාණය කරමින් රෝහණ වීරසිංහයන් වැඩිම දායකත්වයක් ලබා දෙනවා. තවත් එක විශේෂත්වයක් වන්නේ ආනන්ද පෙරේරා සංගීත වේදියා තනුව නිර්මාණය කළ ගියේ සංගීත වාද භාණ්ඩ දහතුන ම වාදනය කළේ ඔහු විසින් ම විම. සෑම භාණ්ඩයක් වෙනුවෙන් ම එක් එක් හඬ පට තීරු නැත්නම් "ට්‍රැක්ස්" වලට ආනන්ද වෙන වෙනම ඒ ඒ භාණ්ඩ වාදනය කළා. වාද්‍ය භාණ්ඩ දහතුනක් තමන් පමණක් වාදනය කළේ ඔහුට හැම භාණ්ඩයක්ම හොඳින් වාදනය කිරීමේ හැකියාව තිබුණ නිසයි. ඒ හැකියාව තියෙන වාද්‍ය ශිල්පීන් ඉතාමත් විරළයි....." සුනිලුන් දුරකථන පිළිසඳර නිමා කලේ ආගිය තොරතුරු පිළිබඳව තවත් දිගු පිළිසඳරකින්ද අනතුරුවයි. "සන්නස" මාසිකයේ "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් අපව දැනුවත් කරමින් ගතකළ හෝරාව පිළිබඳව අපි සුනිලුන්ට ස්තූතිවන්ත වුයෙමු.

කන්ද උඩරට මහනුවර ප්‍රදේශයේ දක්‍ෂ සංගීතාචාර්යවරයකු වශයෙන් ප්‍රවීණයින් ගණනාවක් බිහිකළ සිරිල් පෙරේරා සංගීතවේදියාණන්ගේ පුත්‍ර රත්නයක් වන ආනන්ද පෙරේරා "සිහ ශක්ති" මියැසි කැළේ නියමුවායි. දැනට තරමක අසනීප තත්වයකින් පසුවන ආනන්ද පෙරේරා ප්‍රවීණ වාද්‍ය ශිල්පියාට නිරෝගී සුවය පැතීම සඳහා මෙවර "ගී සඳළුවේ" අවසන් ඡේදය වෙන්වෙයි.


MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**
Senior Migration Consultants:
**Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986**

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696